Media Release 2009/Sin/2

# මාධ්‍ය නිවේදනය

2009.01.06

## විසම්මුතියේ අයිතියට එරෙහි ප්‍රහාරයක්

සිරස මාධ්‍ය ජාලයේ දෙපානම මැදිරි සංකීර්ණයට 6 වෙනිද උදෑසන එල්ල කළ ප්‍රහාරය අදහස් පළ කිරීමේ අයිතියට හා විසම්මුතියේ අයිතියට එරෙහිව එල්ල කළ ප්‍රහරයක් ලෙස සලකන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය එම ප්‍රහාරය දැඩි ලෙස හෙලා දකී.

මෙම සිදුවීම මෑතකාලීනව සිදුවූ මෙවැනි සිද්ධි දමයක උච්ච අවස්ථාවක් ලෙස සැලකිය හැකි අතර එයින් පෙනී යන්නේ රට තුළ නීතියේ ආධිපත්‍යය හා ප්‍රජාතන්ත්‍රවාදී අගයන් ගරාවැටෙමින් ඇති ආකාරයයි.

නිදහස් මාධ්‍යයක පැවැත්ම යහපාලනයක් සඳහා අත්‍යවශ්‍ය අංගයක් බව අවධාරණය කරන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය රටේ ජනතාවට මුහුණ දීමට සිදුවී ඇති මෙම අනාරක්ෂිත තත්වය වහාම වෙනස් කරන ලෙසත් මෙම සිද්ධිය පිළිබඳව නොපමාව, පක්ෂපාතී පරීක්ෂණයක් පවත්වන ලෙසත් බලධාරීන්ගේ ඉල්ලා සිටී.

මෙම සිදුවීමට රාජ්‍යයයේ කිසිදු සම්බන්ධයක් නොමැති බව පසක් කළ හැක්කේ එවන් අපක්ෂපාතී කඩිනම් පරීක්ෂණයකින් පමණි.

ජේ.සී. වැලිඅමුණ
විධායක අධ්‍යක්ෂ,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා